# මහාවිහාරය හා වාරණය

මහාවිහාරයෙන් එදා මහායානයට වැට බැඳීම ඇතැමකු ඊනියා ප්‍රජාතන්ත්‍රවාදයට පටහැණි යැයි කීමට ඉඩ ඇතත් සිංහල බෞද්ධ සංස්කෘතිය සම්බන්ධයෙන් ගත්කල මහාවිහාරික භික්ෂූන් වහන්සේ කළ දේ නිවැරදි ය. ඒ පැහැදිළිව ම මහායානයට එරෙහිව පැනවූ වාරණයක් විය. යම් යම් දේට වාරණ පැනවීම නොකළ යුතු දෙයක් නො වෙයි. අද ද ඒ එසේම ය. එහෙත් අද ඇති තාක්‍ෂණය අනුව වාරණ පැනවීම ඇතැමුන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම අපහසු වී ඇත. එයට හේතුව තාක්‍ෂණය සමග නීතිය වර්ධනය නොවීම මිස අනෙකක් නො වෙයි.

විවිධ සංස්කෘතීන් සංස්කෘතික ආක්‍රමණ හමුවේ ද තමන්ගේ සංස්කෘතියට තර්ජනයක් වන අවස්ථාවන්හි දී ද වාරණ පනවනු දැකිය හැකි ය. අද මෙරට සිටින බොරු ප්‍රබුද්ධයන් ඉංගිරිසි පොතක් පතක් කියවා හෝ නොකියවා හෝ තේරුම්ගෙන හෝ නැතිව හෝ ඊනියා කලා වාරණවලට විරුද්ධව බෙරිහන් දෙනු දක්නට ඇත. ඔවුන්ට අනුව ඊනියා කලාකරුවන්ට ඕනෑම දෙයක් නිර්මාණයකිරීමට අවස්ථාව ලබාදිය යුතු ය. එහෙත් ඒ වෙනුවෙන් ඔවුන්ට සාර්ථක ව පෙනී සිටීමට නො හැකි ය. මිනීමැරුම් හා වෙනත් අපරාධ යුක්තියුක්ත කරන හා ඒ අපරාධ කළයුතු යැයි කියැවෙන ඊනියා කලා කෘතියක් නිර්මාණ කිරීමට ඕනෑම කලාකරුවකු යැයි කියාගන්නා අයකුට නිදහස තිබිය යුතු ද? වැඩිදුර යෑමට පෙර සඳහන් කළයුත්තේ යම් ක්‍රියාවක් අපරාධයක් වන්නේ සංස්කෘතියකට සාපේක්‍ෂ බව ය. එක් සංස්කෘතියක අපරාධයක් ලෙස සැලකෙන ක්‍රියාවක් වෙනත් සංස්කෘතියක අපරාධයක් නොවීමට ඉඩ ඇත.

යම් ක්‍රියාවක් අපරාධයක් වන්නේ ද නැත් ද යන්න සංස්කෘතිය මත පරායත්ත වන විට (depends), නිරපේක්‍ෂ වාස්තවික අපරාධ නැතිවිට සංස්කෘතියකට තමන්ට අවශ්‍ය ආකාරයට වෙනස්වීමට ඉඩදිය නො යුතු ද? මෙහි දී බොරු ප්‍රබුද්ධයන් කියනු ඇත්තේ තම කලාකෘතිය නිර්මාණය කළ යුතු ද නැත් ද යන්න තීරණය කළ යුත්තේ කලාකරුවා බව ය. එහෙත් මෙහි දී ප්‍රශ්නයක් පැන නගී. ඊනියා කලාකරුවා ඒ තීරණය ගන්නේ කෙසේ ද? මෙලොව කිසිවක් නිරපේක්‍ෂ නොවූ කල යමක් නිර්මාණය කළ යුතු ද නැත් ද යන්න හුදු පෞද්ගලික තීරණයක් නො වෙයි. ඕනෑම පුද්ගලයකු සතු හර පද්ධතියක් වෙයි. එක් එක් අයගේ හර පද්ධතිය අඩුවැඩි වශයෙන් වෙනත් අයගේ හර පද්ධතීන්නේ වෙනස් වෙයි. තමාගේ හර පද්ධතියෙහි පිහිටා ජන සමූහයක් වෙනුවෙන් තීරණ ගන්නේ කෙසේ ද?

එහෙත් මෙහි ඇති භයානක ම කරුණ වන්නේ පුද්ගලයකුගේ හර පද්ධතිය, ආචාර ධර්ම ආදිය ඒ පුද්ගලයා පෞද්ගලික ව පමණක් නිර්මාණය කළ දැ නො වීම ය. අද මෙරට සිටින බොරු ප්‍රබුද්ධයන්ගේ හර පද්ධතීන් හා ආචාර ධර්ම මුළුමනින් ම මෙන් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිර්මාණය වී ඇත. තමන්ගේ ම වූ හර පද්ධතියක් නිර්මාණය කරගැනීමට මේ බොරු ප්‍රබුද්ධයන්ට නොහැකි වන්නේ එක් පැත්තකින් ඔවුන්ට ඒ සඳහා අවශ්‍ය නිර්මාණ ශක්තිය නොමැතිවීම හේතුවෙනි. අනෙක් අතට පෞද්ගලික හර පද්ධතීන්ට ක්‍ෂණිකව සමාජයෙන් පිළිගැනීමක් නො ලැබෙයි.

එබැවින් මේ බොරු ප්‍රබුද්ධයෝ කිනම් හෝ වැලක එල්ලීමට උත්සාහ කරති. ඔවුහු එහිදී බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ආචාර ධර්මවලට හා හර පද්ධතියට ඊනියා වාස්තවිකත්වයක් ආරෝපණය කරති. එය ද ඔවුන්ගේ කාර්යයක් නොව ඔවුන්ගේ බටහිර ස්වාමිවරුන්ගේ කාර්යයකි. මේ බොරු ප්‍රබුද්ධයන්ට එවැන්නක් හෝ නිර්මාණය කරගත නො හැකි ය. අද ලෝකයේ තිබෙන ප්‍රධාන ම ප්‍රශ්නය වී ඇත්තේ බටහිරයන්ගේ ආචාර ධර්ම හා හර පද්ධති ඇතුළු දැනුම වාස්තවික දැනුමක් ලෙස හඳුන්වාදීම ය. මේ ඉතාමත් දරුණු ගණයේ සංස්කෘතික යටත්විජිතවාදයකි. බටහිරයන් තමන්ගේ දැනුම අප මත පටවන්නේ තම දැනුම එකම හා ඊනියා වාස්තවික දැනුමක් යැයි කියමින් ය.

වෙනත් සංස්කෘතියකින් අප මත පැටවෙන්නක් අප භාරගත යුතු ද නැත් ද යන්න තීරණය කළ යුත්තේ අප ය. ඒ සඳහා අපට වාරණය යොදාගැනීමට සිදුවෙයි. මහාවිහාරය මහායානයට වැට වැදීමෙන් එවැනි වාරණයක් පැනවී ය. බටහිරයන්ගේ ආචාර ධර්ම හා හර පද්ධතිය අප මත බලෙන් පටවා මෙරට ඊනියා කලාකරුවන්ගේ ආචාර ධර්ම බවට ඒ පත්කර ඔවුන් අපට කියන්නේ ඊනියා කලාවට වාරණ නොතිබිය යුතු බව ය. එවිට අප සංස්කෘතිය ආක්‍රමණයකරමින් අපේ සංස්කෘතිය නැතිකිරීමට උත්සාහ කරන ඊනියා කලාකෘතිවලට අප සම්පූර්ණයෙන් ම දොරටු

© Prof. Nalin De Silva

විවෘත කළ යුතු ය. ඊනියා කලාකරුවන් කියන්නේ තමන්ට කලා කෘති නිර්මාණය කිරීමට පූර්ණ නිදහස තිබිය යුතු බව ය. එහෙත් ලෝකයේ කිසිම කලාකරුවකුට පූර්ණ නිදහසක් නැත. ඕනෑම කලාකරුවකු තම නිර්මාණ කරන්නේ තම අත්දැකීම් මත පදනම් වෙමිනි. ඔහුගේ කලා නිර්මාණය ඔහුගේ අත්දැකීම්වලින් හා ඔහු ලබා ඇති වෙනත් දැනුමෙන් සීමා වෙයි. කෙටියෙන් කිවහොත් කලා නිර්මාණ කලාකරුවාගේ සංස්කෘතියෙන් සීමා වෙයි.

අප රටේ සිටින ඊනියා කලාකරුවන්ගේ සංස්කෘතිය කුමක් ද? ඔවුහු බොහෝ දෙනා බටහිර සංස්කෘතියේ පිටපොත්ත අතගෑවෝ වෙති. බටහිර සංගීතය ගැන පුරසාරම් දොඩන්නන්ට හරිහමන් බටහිර සංගීත ඛණ්ඩයක් නිර්මාණය කිරීමට නො හැකි ය. අනෙක් ඊනියා කලාකරුවන්ගේ තත්වය ද එසේම ය. මෑතක් වන තුරුම ලංකාවෙන් බිහිවුණු ඉංගිරිසි සාහිත්‍යයක් නො වී ය. මේ බව අවබෝධ කරගත් මෙරට බ්‍රිතාන්‍ය කවුන්සිලය (British Council) වෙනත් අය සමග ද එකතු වී ඉංගිරිසි නවකතාවලට තෑගි දීමේ ක්‍රමයක් සකස්කර ඇත. ඔවුහු දැන් ඊනියා ලාංකික ඉංගිරිසියක් ගැන කතාකරති. ලංකාවේ සෑමදාම තිබුණේ ලංකාවට ආවේණික වූ ඉංගිරිසියක් මිස ඔක්ස්ෆර්ඩ් ඉංගිරිසියක් නො වෙයි. එදා ඒ ඊනියා ලාංකික ඉංගිරිසියෙන් ලියැවුණු නවකතා නොතිබූ රටක මේ ලේඛකයන් හදිසියේ පහළ වූයේ කෙසේ ද?

මේ වෙනත් කිසිවක් නොව බටහිර සංස්කෘතික යටත්විජිතවාදය තව තවත් තහවුරුකිරීමේ වෑයමකි. ඉංගිරිසියෙන් ලියන ලේඛකයන් පහළ වූවා නොව එවැන්නෝ නිර්මාණය කරනු ලැබ සිටිති. බටහිර සංස්කෘතියට අදාළ ආකාරයට නවකතා ලියවා ඊනියා කතුවරුන්ට තෑගි දී ඔවුන්ට ඇගයීමක් ලබා දීම මෙහි අරමුණ වෙයි. මෙරට නිපදවන ඇතැම් චිත්‍රපටිවලට ද තෑගි දෙන්නේ මේ අරමුණෙන් ය. ඒ චිත්‍රපටි ඇගයීමේ මිනුම් දණ්ඩ බටහිර මිනුම් දණ්ඩ වෙයි. ඒ ඔස්සේ අපේ සංස්කෘතිය නැතිකිරීමේ බටහිර යටත්විජිතවාදය දිගින් දිගට ම ක්‍රියාත්මක වෙයි. එහි දී අප යම්කිසි වාරණයක් පැනවුවහොත් එයට විරුද්ධව ඊනියා කලාවේ නිදහසේ නාමයෙන් බොරු ප්‍රබුද්ධයෝ උද්ඝෝෂණ කරති.

එහෙත් බටහිරයෝ ඉතා සියුම් ලෙස තම රටවල වාරණ පවත්වාගෙන යති. ඔවුන් එදා කළත් අද චිත්‍රපටියක් තහනම් නොකරනු ඇත. ඔවුන් කරන්නේ එවැනි කලා කෘති ඊනියා විචාරකයන් මගින් නිර්දය විවේචනයට ලක් කිරීම ය. විචාරකයා යන්න ද බටහිර නිර්මාණයකි. ලංකාවේ බොරු ප්‍රබුද්ධයන්ගෙන් නිතර අසන්නට ලැබෙන කරුණක් නම් මෙරට විචාරකයන් හෝ විචාර කලාවක් හෝ නැති බව ය. විචාරකයා යන්න කෙසේ අර්ථවිවරණය කළ ද විචාරකයාගෙන් අවසාන වශයෙන් කෙරෙන්නේ බටහිර රටක දී නම් තම සංස්කෘතියට එකඟ ව කලා කෘතියක් ඇගයීම ය. එමගින් ඉටුවන්නේ වටහිර රටවල සංස්කෘතියට එකඟ කෘති පිළිගැනීමත් බටහිර සංස්කෘතියට විරුද්ධ කෘති ප්‍රතික්ෂේප වීමත් ය. වෙනත් අයුරකින් කිවහොත් විචාරකයා යනු එක්තරා ආකාරයකින් ගත්කල වාරණ කතුර යොදාගන්නෙකි. බටහිර සංස්කෘතියට විරුද්ධ කෘති බටහිර විචාරකයා අතින් වාරණයට ලක්වෙයි.

බටහිරයන් හා මෙරට ඔවුන්ගේ නියෝජිතයන් මේ කියමනට විරුද්ධවනු නො අනුමාන ය. ඔවුන්ට අනුව විචාරකයාට එවැනි කාර්යභාරයක් නැත. එලෙසම ඔවුන් බටහිර වාරණයට ලක්වූ “ලේඩි චැටර්ලීස් ලවර්” වැනි කෘති ද ඉදිරිපත් කර විචාරකයන් හා ඇතැම්විට වාරණ මණ්ඩල අතර ඇති වූ විවාද ද ගෙනහැර දක්වනු ඇත. අප කලින් සඳහන්කර ඇති පරිදි “ලේඩි චැටර්ලිස් ලවර්” නමැති කෘතිය නැගී එන යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය පිළිබිඹු කෙරෙන්නක් විය. ඒ සම්බන්ධයෙන් එංගලන්තයේ වික්ටෝරියා සමාජයේ ඇති වූ විවාදය අන් කිසිවක් නොව මිය යමින් තිබූ කතෝලික සංස්කෘතිය හා නැගී එන යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය අතර වූ අරගලයක පිළිබිඹුවක් විය. එංගලන්තයේ විසූ තම සංස්කෘතියේ විකාශය තේරුම්ගත් ප්‍රබුද්ධ විචාරකයන්ට “ලේඩි චැටර්ලීස් ලවර්” කෘතිය එකල වික්ටෝරියානු සමාජයට නොව අනාගතයට අයත් කෘතියක් විය. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය යුරෝපයට පිටතින් පැමිණි එකක් නො වී ය. ඒ බටහිර සමාජයෙහි ම විකාශයක ප්‍රතිබිම්බය විය. එහෙත් ලංකාවේ ඊනියා ප්‍රබුද්ධයනට එවැනි අනාගත විකාශයක් ගැන සිතිය හැකි නො වෙයි. ඔවුන් දන්නේ අනුකරණය පනණකි. ඔවුන් අමතක කිරීමෙන් රටට යහපත් වාතාවරණයක් උදාකර ගැනීමට හැකි වනු ඇත. අනෙක් අතට මෙරට සංස්කෘතියෙහි අනාගත විකාශය කෙසේ සිදුවන්නේ ද යන්න පිළිබඳ ව දළ අදහසක් හෝ ඇතිකරගන්නේ කෙසේ ද? අපට කළ හැක්කේ අනුකරණය පමණක් ද? අපේ සමාජයෙහි අපේ සම්ප්‍රදායෙහි කෙරෙන විකාශයක් බොරු ප්‍රබුද්ධයන් විසින් හැඳින්වෙන්නේ ආපසු යෑමක් ලෙස ය. එහෙත් සංස්කෘතික යටත්විජිතවාදය හේතුවෙන් මෙරට ඊනියා බුද්ධිමය ආධිපත්‍යය ඇත්තේ ඔවුන්ට ය.

© Prof. Nalin De Silva

බටහිර සමාජයෙහි වර්තමානයෙහි බොහෝ විට වාරණ මණ්ඩල නැති වුවත් ඒ කාර්යය විචාරකයන් ලවා ඉටුකරගැනීමට බටහිරයෝ දනිති. එහි දී විචාරකයන් සංස්කෘතිය ගැන කතා නොකරනු ඇත. කලා කෘතිය ඊනියා ශුද්ධ කලා කෘතියක් ලෙස ගෙන විවේචනය කරන බව කියනු ඇත. පසුගිය දා බටහිර සංස්කෘතියට එකඟ නොවූ ඩා වින්චි චිත්‍රපටිය සම්බන්ධයෙන් එවැනි තත්වයක් උද්ගත විය. සාහිත්‍ය කලා ක්‍ෂෙත්‍රවල එසේ සිදුවන අතර, අනෙක් ක්‍ෂෙත්‍රවල ද ඔවුහු විවිධාකාරයෙන් තමන්ට අහිතකර සංස්කෘතීන්ට එරෙහි ව්‍යාපාරය ගෙන යති. බටහිරයන් විශේෂයෙන් ම තම විවේචනය හා විරෝධය එල්ලකරන්නේ මුස්ලිම් සංස්කෘතියට ය. එයට එක් හේතුවක් නම් මුස්ලිම් සංස්කෘතිය ද අවසාන වශයෙන් ගත්කල යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය බිහි වූ පසුබිමෙහි ම බිහිවීම ය. අද බටහිර ජනතාව ඉල්ලන යම්කිසිවක් දීමට මුස්ලිම් සංස්කෘතියට හැකි වී තිබේ. යුදෙව් ක්‍රිස්තියානි සං‍ස්කෘතිය, කතෝලික සංස්කෘතිය හා මුස්ලිම් සංස්කෘතිය එකම මූලයකින් පැන නැගුණු සංස්කෘතීන් වේ.

කතෝලික සංස්කෘතියෙහි මෙන් ම මුස්ලිම් සංස්කෘතියෙහි ද සාමූහිකත්වය වෙයි. සමාජය වෙනුවට පුද්ගලයා ප්‍රධානත්වයට පමුණුවනු ලැබුයේත් අනෙක් අයගෙන් වෙන්කරනු ලැබුවේත් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය විසිනි. අවුරුදු සිය ගණනකට පසුව එසේ අනෙක් අයගෙන් වෙන් වූ මිනිසා අද තමන්ගෙන් ද වෙන්වීමට පටන්ගෙන ඇත. එසේ දුඃඛිත තත්වයකට පමුණුවනු ලැබූ බටහිරයන් ඉන් ගැලවීම සඳහා විකල්ප සොයනු දැකගත හැකි ය. එහි දී සාමූහිකත්වය ඇති සංස්කෘති ඔවුන්ගේ අවධානයට ලක් වෙයි. කතෝලික සංස්කෘතිය යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය විසින් පරාජයට පත්කෙරී ඇති බැවින් බටහිරයන් නැවතත් යුරෝපීය වැඩවසම් කතෝලික සංස්කෘතියට ආපසු නොයනු ඇත. එවිට එකම මූලාශ්‍රවලින් ගොඩ නැගුණු මුස්ලිම් සංස්කෘතිය දෙසට බටහිරයන් ආකර්ෂණය වීමට ඇති ඉඩකඩ ඉතා අධික ය. අද බටහිර පාලකයන් වෙහෙසෙන්නේ මේ මුස්ලිම් ආකර්ෂණයට එරෙහිව ය. සමස්ත ලෝකය ම ගත්කල බටහිරයෝ මුස්ලිම් සංස්කෘතියට එරෙහි ව බටහිර ආසියාවෙහි යුද්ධ ප්‍රකාශ කරති. ඔවුහු තම රටවල විවිධ උපලම මගින් මුස්ලිම් සංස්කෘතියට එරෙහි ව ක්‍රියාකරති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva